# සබරගමු පළාත් අධ්‍යාපන දෙපාතර්මේන්තුව

## ජූලි 01 වන සතිය - බුද්ධ ධර්මය - 4 ශ්‍රේණිය

සැකසුම - එම්.වී.සම්පත් බන්ධු ගුණසේකර - ර/බල/වෙළහපොළ විද්‍යාලය

**<u>පුංචි දුවේ පුතේ, අම්මට හරි තාත්තට හරි මේ ප්‍රශ්න ටික අහන්න කියන්න.ඔයගොල්ලො උත්තර දෙන්න.</u>**

1. සුභාෂිත වචන යනු මොනවාද?
2. සුභාසිතා ච යා වාචා යන ගාථාව කියන්න.
3. සමගිය බලය වේ  යන කවිය කියන්න.
4. ගේ දොර පිළිවෙළකට තබා ගැනීමෙන් අපට ලැබෙන වාසි තුනක් කියන්න.
5. ගේ දොර පිළිවෙළකට තබා ගැනීමට අපට කළ හැකි දේවල් තුනක් කියන්න.
6. සමගියේ අගය කියාදෙන සතුන් තුන්දෙනෙක් කියන්න.
7. ආගන්තුකයන් යනු කවුද?
8. තරිඳුලාගේ නිවසට පැමිණි ආගන්තුකයන් කවුද?
9. නිවසට පැමිණෙන ආගන්තුකයන් වෙනුවෙන් කළ යුතු දේවල් තුනක් කියන්න.
10. පුංචි ඔබට දෙමාපියන්ට උදව් විය හැකි ආකාරය කියන්න.

**<u>දැන් අපි මේවට උත්තර ලියමු දුවේ පුතේ,</u>**

- පහත සඳහන් වැකි හරි නම් (√) ලකුණ ද වැරදි නම් (x) ලකුණ ද වරහන් තුළ යොදන්න.

1. නිවසේ වැඩ බෙදාගෙන කටයුතු කළ යුතුය. (   )
2. කුමුදුගේ නිවසට ආගන්තුකයෝ ආහ. (   )
3. යහපත් වචනකතා කළයුත්තේ නිවසේ දී පමණය. (   )
4. සුජානිට ළමයෙක් නරක වචනයෙන් බැන්නේ ය (   )
5. කසුන්ගේ නිවස අපිළිවෙළට ඇති තැනකි. (   )

- හිස්තැනට ගැළපෙන  නිවැරදි පිළිතුර යටින් ඉරක් අදින්න.

1. කසුන්ගේ නිවසියන් ................සිටී. (සමගියෙන්/ අසමගියෙන් )
2. .................නැන්දා කසුන්ගේ නිවසේ කටයුතුකරයි. (කුසුමා / ලීලාවතී)
3. සමගියේ අගය .............. අපට කියා දෙයි. (කුඹියා / මියා)
4. සැම විටම කතා කළයුත්තේ .................. වචනය. (යහපත් /අයහපත්)
5. තරිඳුගේ නිවසට පැමිණියේ ................ ය. (බාප්පලා/ ලොකු තාත්තලා )

සැම දෙනාම පරිස්සමට ගෙදර ඉන්න. බුදු සරණයි !